සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 12 - 2023**

විභාග අංකය: ....................................

# දේශපාලන විද්‍යාව - I

කාලය පැය 02 යි

**උපදෙස් :**

- **මෙම ප්‍රශ්න පත්‍රය A හා B යනුවෙන් කොටස් 02 කි.**
- **A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් සමන්විතය.**
- **සියළු ප්‍රශ්නවලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුය.**
- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

---

## A කොටස

- අංක 01 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(01) දේශපාලනය යනු,
(1) ආණ්ඩුව ඇතුළත සිදුවන ක්‍රියාකාරකම් ය.
(2) රාජ්‍ය බලය හා සම්බන්ධ ක්‍රියාවලියකි.
(3) දේශපාලඥයින්ට පමණක් අදාළ වන ක්‍රියාවලියක් වේ.
(4) රාජ්‍ය සහ සමාජය අතර අන්තර් ක්‍රියාකාරකම් සිදුවන ක්ෂේත්‍රයකි.
(5) සමාජ ක්‍රියාවලියක් පමණි. (......)

(02) දේශපාලන විද්‍යාව යනු,
(1) ක්‍රි. පූ. 7වන සියවසේ ආරම්භ විය.
(2) විද්‍යාත්මක අධ්‍යයනයට සීමාවන ශික්ෂණයකි.
(3) විෂය පථය හා අන්තර්ගතය වෙනස් වෙමින් ඉදිරියට වර්ධනය වී තිබේ.
(4) දේශපාලනයේ යෙදෙන්නන් අනිවාර්යයෙන් හැදෑරිය යුතු ය.
(5) ප්‍රවේශ, න්‍යාය හා විධික්‍රම එකම මූලයකින් ප්‍රභවය ලබා ඇත. (......)

(03) තුලනාත්මක අධ්‍යයන ක්‍රමය,
(1) ප්‍රධාන ධාරා හතරකි.
(2) දේශපාලන ප්‍රපංච, ගැටලු හා තේමා සංසන්දනාත්මක ව අධ්‍යයනය කරයි.
(3) සමකාලීන තුලනාත්මක ප්‍රවේශයේ විෂය පථය බෙහෙවින් ම අනම්‍ය වේ.
(4) ආනුභූතිකව නිරීක්ෂණය කළ හැකි තේමා පමණක් අධ්‍යයනය කරයි.
(5) දේශපාලනය පිළිබඳ අතිමූලික ගැටලු මතුකරමින් ඒවා විභාග කරයි. (......)

(04) චර්යාවාදී ප්‍රවේශය,
(1) සමාජීය විද්‍යාවන් හි පමණක් යොදාගනී.
(2) ආනුභවික පර්යේෂණ මත පදනම් වූ දැනුමක් ගොඩනගයි.
(3) වටිනාකම් විනිශ්චයන්ගෙන් යුතු වේ.
(4) පර්යේෂකයන්ගේ ආත්මීය නිගමන ද ඇතුළත් විය යුතු ය.
(5) මෙහි වැදගත්කම වර්තමානය වන විටත් නොනැසී පවතී. (......)

(05) දේශපාලන දර්ශනය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,
(1) ප්‍රත්‍යක්ෂ මූලික දත්ත හා සාධක මත පදනම් වේ.
(2) දේශපාලන ක්‍රියාකාරීත්වයට අදාල ප්‍රතිමානීය නිෂ්ඨාවන් යෝජනා කරයි.
(3) සෑම දාර්ශනික අදහසක් ම යථාර්ථවාදී වේ .
(4) වර්තමානය දක්වාම මෙහි ජනප්‍රියතාව නොනැසී පවතී.
(5) දේශපාලන තේමා පිළිබඳ දාර්ශනිකයින් අතර පොදු එකඟතාවයක් ඇත. (......)

(06) දේශපාලන මතවාද,

(1) සමාජ කොටස් දේශපාලන ක්‍රියාකාරීත්වයට යොමු නොකරයි.

(2) සමාජයේ දේශපාලනයට බලපෑම් නොකරයි.

(3) විශාල ජන කොටසක් ආකර්ශනය කර නොගනී.

(4) දේශපාලන මතිමතාන්තර හා විශ්වාස ආදියෙන් සමන්විත ය.

(5) ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට බලපෑම් නොකරයි. (......)

(07) ලිබරල්වාදී මූලධර්මයක් නොවන්නේ,

(1) පුද්ගල නිදහස (2) බලතල වෙන් කිරීම (3) පොදු දේපල ක්‍රමය

(4) සංවරණ හා තුලන (5) නීතියේ ආධිපත්‍යය (......)

(08) සමකාලීන දේශපාලන දාර්ශනිකයෙක් වනුයේ,

(1) මහත්මා ගාන්ධි (2) ඇඩම් ස්මිත් (3) මැකියා වෙලි

(4) හොබ්ස් (5) ජෝන් ලොක් (......)

(09) දේශපාලනය පක්ෂ සම්බන්ධයෙන් සාවද්‍ය වන්නේ,

(1) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ නැතිවම බැරි අංගයකි.

(2) සමාජ කණ්ඩායම්වල දේශපාලන අරමුණු සම්පාදනය කරයි.

(3) දේශපාලන පක්ෂවලට ප්‍රතිපත්තිමය හා මතවාදී අනන්‍යතාවයක් ඇත.

(4) ආණ්ඩුවේ කටයුතු සංවිධානගත කරයි.

(5) මුලින්ම ආරම්භවන්නේ විසිවන සියවසේ මැද භාගයේදී ය. (......)

(10) පූර්ව නූතන ජාතික රාජ්‍යය,

(1) 16වන සියවසට පෙර ක්‍රියාත්මක විය,

(2) නිශ්චිත දේශසීමා සහිතය.

(3) බලය මධ්‍යගත වී තිබුණි.

(4) 'එක් ජාතියකට එක් රාජ්‍යයකි.' යන සංකල්පය මත නිර්මාණය වී තිබුණි.

(5) තුළ එක් සංස්කෘතික අනන්‍යතාවයක් සහිත ජනතාවක් ජීවත් විය. (......)

(11) ගෝලීයකරණය තුළ,

(1) භෞමිකත්වය ඉතා වැදගත් කොට සලකයි.

(2) 'ජාතිය' යන අදහසෙහි වැදගත්කම වැඩි කරයි.

(3) මිනිසුන් එකට බැඳ දමා ඇත්තේ තාවකාලික සම්බන්ධතා ජාල මතයි.

(4) ජාතික රාජ්‍ය ශක්තිමත් කරයි.

(5) ජාත්‍යන්තර සංවිධානවලට බලගතු රාජ්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය සීමා කළ නොහැක. (......)

(12) සමාජවාදී රාජ්‍ය,

(1) ධනවාදී හා ලිබරල්වාදී රාජ්‍ය මාදිලියට පෙර වර්ධනය විය.

(2) මෙය ධනවාදී රාජ්‍ය මාදිලියට විකල්පයක් නොවේ.

(3) සමාජයේ පන්ති විභේදනයක් පැවතිය යුතු බව පෙන්වා දෙයි.

(4) දේශපාලන පක්ෂ මත පදනම් වූ තරගකාරීත්වයක් සහිතව කටයුතු කරයි.

(5) සමාජවාදී පොදු අධිකාරිය ස්ථාපනය කිරීම අරමුණු කරගනී. (......)

(13) රාජ්‍ය හා පුරවැසියා සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය වන්නේ,

(1) රාජ්‍ය විසින් පුරවැසියන්ට දේශපාලන අයිතිවාසිකම් ලබාදෙයි.

(2) පොදු තීරණ ගැනීමේ ක්‍රියාවලියට පුරවැසියන් නියෝජිතයන් මාර්ගයෙන් සම්බන්ධ වෙයි.

(3) රාජ්‍යයට කිසිවිටෙක පුරවැසිභාවය අහිමි කළ නොහැකි ය.

(4) පුරවැසියන් රාජ්‍යයට අවනත විය යුතු ය.

(5) රාජ්‍ය විසින් පුරවැසියන් සුභසාධනය කරයි. (......)

(14) ඒකීය ආණ්ඩුක්‍රමය,

(1) ජනවාර්ගික බෙදීම් සහිත රාජ්‍යයන් සඳහා වඩාත් සුදුසු වේ.

(2) මෙහි ව්‍යවස්ථාදායකය බොහෝ විට ද්වීමණ්ඩලවාදය මත පදනම් වේ.

(3) සංකීර්ණ හා කාර්යක්ෂම ආණ්ඩුක්‍රමයකි.

(4) පළාත් ආණ්ඩු ආයතන අහෝසි කිරීමේ හැකියාවක් මධ්‍යම ආණ්ඩුවට නැත.

(5) පවතින රාජ්‍යවල ස්වාධිපත්‍ය මුලුමනින්ම රැඳී පවතින්නේ මධ්‍යම ආණ්ඩුව වෙතයි. (......)

(15) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය,

(1) මෙහි විධායක බලය හිමි වන්නේ අගමැතිවරයාට පමණි.

(2) රාජ්‍ය නායකයා ඍජු ලෙසින් ම තෝරාපත් කරගනී.

(3) මේ තුළ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පැහැදිලි බෙදීමක් පවතී.

(4) මෙහිදී විධායකය ව්‍යවස්ථාදායකය මත රඳා පවතී.

(5) බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල පමණක් දක්නට ලැබේ. (......)

(16) සන්ධීය ආණ්ඩුක්‍රමයේ අයහපත් ලක්ෂණයක් වන්නේ,

(1) රාජ්‍ය තුළ කේන්ද්‍රපසාරී බලපෑම් ශක්තිමත් වීම.

(2) ප්‍රාන්ත ආණ්ඩු මධ්‍යම ආණ්ඩුව තුළ යම් නියෝජනයක් ලැබීම.

(3) පුද්ගල නිදහස ආරක්ෂා කිරීමට ආධාර කරන සංවරණ හා තුලන ජාලයක් නිර්මාණය වීම.

(4) භින්න වූ සමාජයක් එක්සත්ව සහ ඒකාබද්ධව පවත්වා ගැනීමට හැකිවීම.

(5) විශාල රාජ්‍යයක් සංවිධානය කිරීමට ස්වාභාවික හා ප්‍රායෝගික සැලසුමක් මේ හරහා ලබාදීම. (......)

(17) ෆැසිස්ට්වාදයේ ලක්ෂණයක් නොවන්නේ,

(1) පෞද්ගලික නිදහස (2) රාජ්‍ය වන්දනය (3) අත්‍යන්ත රණවාදය

(4) අත්‍යන්ත වර්ගවාදය (5) දේශපාලන ඒකබලවාදය (......)

(18) සමූහාණ්ඩුවාදය,

(1) රාජ්‍ය නායකයා මහජන ඡන්දයෙන් පත් නොවිය යුතු බව කියයි.

(2) ලිබරල්වාදයට සමාන්තරව වර්ධනය විය.

(3) රාජාණ්ඩුවාදයට සමාන ලක්ෂණ සහිතය.

(4) මෑතකාලීන මතවාදයකි.

(5) අවධි 3ක් ඔස්සේ වර්ධනය විය. (......)

(19) ජාතික වාදය,

(1) දාර්ශනික වශයෙන් පොහොසත් ය.

(2) මහා දාර්ශනිකයන්, චින්තකයන් විසින් නිර්මාණය කර ඇත.

(3) ප්‍රධාන ප්‍රවේශ තුනක් යටතේ හඳුනාගත හැක.

(4) මතවාදයක් පමණක් මිස දේශපාලන ව්‍යාපාරයක් නොවේ.

(5) ස්වයං තීරණ අයිතිය පිළි නොගනී. (......)

(20) ගැටුමේ සාධනීය කාර්යයක් නොවන්නේ,

(1) සමාජය එකතැන පල්වීම වැළැක්වීම.

(2) සමාජ ප්‍රශ්න විසඳීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම.

(3) පුද්ගලයන් හා සමාජය වෙනස්වීමට දායක වීම.

(4) සමාජ කණ්ඩායම්වල ඒකාග්‍රතාව ශක්තිමත් වීම.

(5) අන්තර් රාජ්‍ය යුද්ධ හා අවි ගැටුම්. (......)

- **අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

(21) බ්‍රිතාන්‍යයන් විසින්,

A - ඉඩම් පිළිබඳ පෞද්ගලික අයිතිය හඳුන්වාදෙන ලදී.

B - ඉඩම් පිළිබඳ තරගකාරී වෙළඳපොළක් හඳුන්වාදෙන ලදී.

C - රාජකාරී ක්‍රමය අහෝසිකරන ලදී.

D - මුදලින් බදු ගෙවීම හඳුන්වා දෙන ලදී.

E - ඍජු බදු ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABC (......)

(22) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ,

A - වාර්ගික නියෝජනය අහෝසි කරන ලදී.

B - ජනතාව දේශපාලන වශයෙන් සවිබල ගැන්විය.

C - ක්‍රියාත්මක කිරීමට දේශපාලන පක්ෂ ක්‍රමයක් අවශ්‍ය නොවීය.

D - සීමිත ඡන්ද බලය හඳුන්වා දෙන ලදී.

E - විධායක කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(23) වෙස්ට්මිනිස්ටර් ආණ්ඩුක්‍රමයක ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ,

A - ආණ්ඩුක්‍රම ව්‍යුහය තුළ කේන්ද්‍රීය ස්ථානය පාර්ලිමේන්තුවට හිමිවීම.

B - ව්‍යවස්ථා විවරණ බලය අධිකරණයට හිමිවීම.

C - ආණ්ඩුව පාර්ලිමේන්තුව මගින් පාලනය කිරීම.

D - පාර්ලිමේන්තුවෙන් පත් වූ මන්ත්‍රීන්ගෙන් ආණ්ඩුව සකස් වීම.

E - සාමූහික වගකීම ක්‍රියාත්මක වීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(24) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A - පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

B - ලංකාව නිදහස් ස්වෛරී ජනරජයක් බවට පත්කරන ලදී.

C - ආණ්ඩුක්‍රම යාන්ත්‍රණය බලතල බෙදීමේ මූලධර්මය මත ගොඩනගන ලදී.

D - පාර්ලිමේන්තු පරමාධිපත්‍යයට කේන්ද්‍රීය වැදගත්කමක් ලබා දෙන ලදී.

E - ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස ව්‍යවස්ථාගත කරන ලදී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(25) සෝල්බරි ව්‍යවස්ථාවෙහි සුළු ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යොදාගත් විධිවිධාන වන්නේ,

A -අග්‍රාණ්ඩුකාර ධූරයක් ස්ථාපිත කිරීම.

B -නාමකරණයෙන් මන්ත්‍රීවරු හයදෙනෙකු මහජන මන්ත්‍රී මණ්ඩලයට පත් කිරීම.

C -සෙනෙට් සභාව

D -29 (2) වගන්තිය

E -බහු මන්ත්‍රී ආසන ක්‍රමය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

- අංක 26 - 30 දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දක්වෙන 1, 2, 3, 4, 5 යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍ය | සත්‍ය |
| 2 | සත්‍ය | අසත්‍ය |
| 3 | අසත්‍ය | සත්‍ය |
| 4 | අසත්‍ය | අසත්‍ය |
| 5 | සත්‍ය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් තහවුරු කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (26) | යටත්විජිත ප්‍රතිපත්තිය මගින් මෙරට සමාජ කණ්ඩායම්වල උඩුකුරු සමාජ සචලතාවයක් ඇති විය. | යටත්විජිතවාදය යටතේ පුද්ගලවාදය වෙනුවට කණ්ඩායම්වාදය රජයන නෛතික සම්බන්ධතා ඉදිරියට ආවෝ ය. (........) |
| (27) | රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්ම හා මානව අයිතිවාසිකම් පිළිබඳ විධිවිධාන 1972 ව්‍යවස්ථාවට ඇතුලත් කෙරිණි. | නමුත් මෙකී විධිවිධාන අධිකරණය මගින් ක්‍රියාත්මක කරවාගත නොහැකි විය. (........) |
| (28) | 1947 ආණ්ඩුක්‍රමය යටතේ ලංකාවේ ඉල්ලීම මත ලංකාව වෙනුවෙන් නීති පැනවීමේ බලය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට හිමි විය. | යම් පනතක් ව්‍යවස්ථාවට අනුකූල නොවේ නම් ඒ නීති බල රහිත කිරීම් බලය 1947 ආණ්ඩු ක්‍රමය යටතේ අප්‍රකාශිතව අධිකරණයට හිමි විය. (........) |
| (29) | 1947 ආණ්ඩුක්‍රමය යටතේ රාජ්‍ය සේවය මුළුමනින් ම ඇමතිවරුන්ගේ ග්‍රහණයට නතු වීය. | 1972 ආණ්ඩුක්‍රමය යටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිහිටුවන ලදී. (........) |
| (30) | විධායක කාරක සභා ක්‍රමය නිසා 1931 ආණ්ඩුක්‍රමය යටතේ පාලනය ඉතා අකාර්යක්ෂම විය. | එමෙන් ම සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීම නිසා ලංකාවේ වාමාංශික පක්ෂ තවදුරටත් වර්ධනය විය. (........) |

## B කොටස

31. දේශපාලන විද්‍යාව හැදෑරීම යන්නෙහි අර්ථ කිහිපයකි. ඉන් දෙකක් වන්නේ,

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

32. පුරවැසියන්ට නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල ඉටුකළ හැකි වැදගත් කාර්ය ගණනාවකි. ඉන් දෙකක් ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

33. සමාජයේ පවත්නා ආයතන වර්ගීකරණය කෙරෙන ආකාර දෙක ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

34. සමාජයේ පවත්නා ව්‍යවස්ථාදායක ආයතන 02ක් ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

35. රාජ්‍යයේ සමකාලීන කාර්යයන් දෙකක් දක්වන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

36. ස්වාධිපත්‍ය පැතිකඩ දෙකකි. ඒ මොනවා ද?

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

37. ලිබරල්වාදය ප්‍රභේද තුනක් ඔස්සේ හඳුනාගැනීමට පුළුවන. ඉන් දෙකක් ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

38. ඒකීය රාජ්‍යයන්හි මධ්‍යයේ සිට පහළ මට්ටම්වලට පරිපාලන බලය විසුරුවා හැරීම ප්‍රධාන ආකාර තුනකි. ඉන් දෙකක් ලියන්න.

(1) ..............................................................................................................................................

(2) ..............................................................................................................................................

39. ඓතිහාසික වශයෙන් සන්ධීය ආණ්ඩුක්‍රම පිහිටුවා ගැනීමේ මාර්ග 02ක් ලියන්න.

(1) ..............................................................................................................................................

(2) ..............................................................................................................................................

40. අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ 02ක් ලියන්න.

(1) ..............................................................................................................................................

(2) ..............................................................................................................................................

41. ලිබරල්වාදය ලෝකය තුළ මුල්බැස ගැන්වීමට විශාල දායකත්වයක් දැක්වූ චින්තකයන් දෙදෙනෙක් නම් කරන්න.

(1) ..............................................................................................................................................

(2) ..............................................................................................................................................

42. සමූහාණ්ඩුවාදයේ මූලධර්ම දෙකක් දක්වන්න.

(1) ..............................................................................................................................................

(2) ..............................................................................................................................................

43. ලිබරල් නිරාගමිකවාදයේ මූලධර්ම දෙකක් දක්වන්න.

(1) ..............................................................................................................................................

(2) ..............................................................................................................................................

44. ගැටුම් පිළිබඳ සරල වර්ගීකරණයේ ආකාර දෙකක් දක්වන්න.

(1) ..............................................................................................................................................

(2) ..............................................................................................................................................

45. ගැටුම් ජීවන චක්‍රයේ අවධි 02ක් දක්වන්න.

(1) ..............................................................................................................................................

(2) ..............................................................................................................................................

46. ගැටුම් වැළැක්වීම ආකාර දෙකකි ඒ මොනවා ද?

(1) ..............................................................................................................................................

(2) ..............................................................................................................................................

47. යටත් විජිත බිහි වූ ආකාර දෙකකි. ඒවා ලියා දක්වන්න.

(1) ..........................................................................................................................................

(2) ..........................................................................................................................................

48. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ සෙනෙට් සභාව පිහිටුවීමේ අරමුණු 02ක් ලියන්න.

(1) ..........................................................................................................................................

(2) ..........................................................................................................................................

49. සෝල්බරි ආණ්ඩුක්‍රමයට සාපේක්ෂව 1972 ආණ්ඩුක්‍රමයේ ඇති කළ වෙනස්කම් දෙකක් ලියන්න.

(1) ..........................................................................................................................................

(2) ..........................................................................................................................................

50. 1. 1972 ආණ්ඩුක්‍රමය යටතේ පිහිටවූ විශේෂ අධිකරණය කුමන නමකින් හැඳින්වේ ද?

..........................................................................................................................................

2. එහි කාර්යභාරය කුමක් ද?

..........................................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 12 - 2023**

විභාග අංකයඃ ...................................

# දේශපාලන විද්‍යාව - II

**කාලය පැය 03 යි**
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

සැලකිය යුතුයි

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ.
- පළමුවැනි කොටසින් අවම වශයෙන් <u>එක්</u> ප්‍රශ්නයක් ද, දෙවැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න <u>දෙකක්</u> ද තුන්වැනි කොටසින් අවම වශයෙන් <u>එක්</u> ප්‍රශ්නයක් ද, වන සේ තෝරාගෙන ප්‍රශ්න <u>05 කට</u> පිළිතුරු සපයන්න.

## I කොටස

01. දේශපාලනය යන්න සමාජයේ පැවතීමේ පැතිකඩ කීපයකි. විමසන්න. (ලකුණු 20)

02. දේශපාලනය යනු කුමක් ද? විමසන්න. (ලකුණු 20)

03. පහත ප්‍රවේශ අතුරින් ඕනෑම දෙකක් විස්තර කරන්න.
 (i) දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය
 (ii) තුලනාත්මක ප්‍රවේශය
 (iii) චර්යාවාදී ප්‍රවේශය
 (iv) දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය. (ලකුණු 10 × 2 = 20)

## II කොටස

04. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක් සාකාච්ඡා කරන්න.
 (i) නූතන ජාතික රාජ්‍ය (ii) රාජ්‍ය සහ ස්වාධිපත්‍ය
 (iii) යටත් විජිත රාජ්‍ය (iv) රාජ්‍ය සහ පුරවැසියා (ලකුණු 10 × 2 = 20)

05. සන්ධීය ආණ්ඩු ක්‍රමය ඒකීය ආණ්ඩුක්‍රමයෙන් වෙනස් වන්නේ කෙසේ ද? විමසන්න. (ලකුණු 20)

06. පහත දැක්වෙන ආණ්ඩුක්‍රම අතරින් දෙකක් විස්තර කරන්න.
 (i) ජනාධිපති ආණ්ඩුක්‍රමය (ii) මිශ්‍ර ආණ්ඩුක්‍රමය
 (iii) පාර්ලිමේණ්තු ආණ්ඩුක්‍රමය (iv) අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමය (ලකුණු 10 × 2 = 20)

07. (i) රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනස්කම් සාකච්ඡා කරන්න.
 (ii) දේශපාලන පක්ෂ හා බලපෑම් කණ්ඩායම් අතර වෙනස්කම් සසඳන්න. (ලකුණු 10 × 2 = 20)

## III කොටස

08. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා දක්වා ඉන් ලංකාව තුල ඇතිකළ පරිවර්තනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

09. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය සෝල්බරි ආණ්ඩුක්‍රමයෙන් වෙනස් වන්නේ කෙසේ ද? විමසන්න. (ලකුණු 20)

10. පහත මාතෘකා අතරින් ඕනෑම දෙකක් පමණක් සාකච්ඡා කරන්න.
 (i) ගැටුම් ජීවන චක්‍රය
 (ii) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
 (iii) 1931 සර්ව ජන ඡන්ද බලය
 (iv) 1972 ජනාධිපතිධූරය
 (v) සිවිල් සමාජය (ලකුණු 10 × 2 = 20)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

12 ශ්‍රේණිය

# තෙවන වාර පරීක්ෂණය - 2023

පිළිතුරු පත්‍රය

## දේශපාලන විද්‍යාව

### I - පත්‍රය

### A - කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - (4) | 2 - (3) | 3 - (2) | 4 - (2) | 5 - (2) | 6 - (4) | 7 - (3) | 8 - (1) | 9 - (5) | 10 - (1) |
| 11 - (3) | 12 - (5) | 13 - (3) | 14 - (5) | 15 - (4) | 16 - (1) | 17 - (1) | 18 - (2) | 19 - (3) | 20 - (4) |
| 21 - (1) | 22 - (5) | 23 - (4) | 24 - (3) | 25 - (2) | 26 - (2) | 27 - (5) | 28 - (1) | 29 - (4) | 30 - (2) |

(2 x 30 = 60)

### B - කොටස

31. (1) දේශපාලනය හා රාජ්‍ය සම්බන්ධ පැතිකඩ ඉගෙන ගැනීම
    (2) පවතින න්‍යාය හා සංකල්ප විචාරයට ලක් කිරීම ......... ආදී

32. (1) මැතිවරණයේ දී ඡන්දය පාවිච්චි කිරීම හෝ නොකිරීම
    (2) දේශපාලන පක්ෂවල සාමාජිකයෙකු වීම හෝ නොවීම ..... ආදී.

33. (1) විධිමත් (2) අවිධිමත්

34. (1) පාර්ලිමේන්තුව (2) සන්ධීය ව්‍යාවස්ථාදායක මණ්ඩල
    (3) පළාත්සභා ........... ආදී

35. (1) ආර්ථික පරිපාලනය හා මෙහෙයවීම
    (2) නීතියේ, සමාජ පර්යායේ හා දේපලවල භාරකාරත්වය .... ආදී.

36. (1) අභ්‍යන්තර ස්වාධිපත්‍යය (2) බාහිර ස්වාධිපත්‍යය

37. (1) සම්භාව්‍ය ලිබරල්වාදය (2) පශ්චාත් සම්භාව්‍ය ලිබරල්වාදය
    (3) නව ලිබරල්වාදය

38. (1) බලය විතැන් කිරීම (2) පරිපාලනය විමධ්‍යගත කිරීම
    (3) බලය පැවරීම

39. (1) පොදු අභිලාෂයන් හඹායාම පිණිස කලින් වෙන්ව පැවති ඒකක එකට එකතුව මධ්‍යම අධිකාරියක් නිර්මාණය කර ගැනීම.
    (2) බෙදුනු රාජ්‍යක් එකට එකතු වෙමින් සන්ධීය පාලන ක්‍රමයක් ලෙසින් ප්‍රතිව්‍යුහගත වීම.
    (3) ඒකීය රාජ්‍යයක් වාර්ගික හා සංස්කෘතික විවිධත්වය මත සන්ධීය රාජ්‍යයක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීම.

40. (1) ජනාධිපතිවරයා ජනතාවගේ ඡන්දයෙන් තෝරාපත් කරගත් අයෙකු වීම.
    (2) ජනාධිපතිවරයා අභිමුඛව විධායක බලතල සහිත අගමැතිවරයා හා ඇමති මණ්ඩලයක් සිටීම ......... ආදී.

41. (1) තෝමස් හොබ්ස් (2) ජෝන් ලොක් (3) රූසෝ

42. (1) සම්භාව්‍ය සමූහාණ්ඩුවාදය (2) යුරෝපයේ පුනරුද සමය ......... ආදී

43. (1) රාජ්‍ය ආගම සමග අනන්‍ය නොවීම සහ ආගමික අධ්‍යයනයට හා ප්‍රචාරණයට රාජ්‍ය සම්බන්ධ නොවීම.
    (2) රාජ්‍ය කිසිම ආගමකට පක්ෂපාතීත්වයක් නොමැති විය යුතු වීම. .......... ආදී.

44. (1) පුද්ගලාභ්‍යන්තර ගැටුම් (2) අන්තර් පුද්ගල ගැටුම්
    (3) කණ්ඩායම් ඇතුළත ගැටුම් (4) අන්තර් කණ්ඩායම් ගැටුම්

45. ගැටුම් පැන නැගීම (2) උත්සන්න වීම .......... ආදී.

46. (1) සරල වැළක්වීම (2) ගැඹුරු වැලැක්වීම.

47. (1) කිසියම් රාජ්‍යයක ජනතාව නව දේශයක් සොයාගෙන එය ජනාවාස කර මව් රාජ්‍යයේ සමාජ, දේශපාලන සහ ආර්ථික ක්‍රමවලට අනුරූප වූ සංස්ථා ගොඩනගාගෙන මව් රාජ්‍යයේ ආධිපත්‍යයට යටත්ව එම නව දේශය පවත්වා ගැනීම.
(2) පෙර ජනාවාස වූ ප්‍රදේශයක් බලගතු රාජ්‍යයක් විසින් ගිවිසුමකින් හෝ යුධ බලයෙන් හෝ ඇදාගෙන, තම ආධිපත්‍යය යටතේ පාලනය කිරීම.

48. (1) මහජන මන්ත්‍රී මණ්ඩලයේ හදිසි හා අපරික්ෂාකාරී පනත් පාලනය කිරීම.
(2) සුළු ජන කොටස්වල ආශාවන් ආරක්ෂා කිරීම. .......... ආදී.

49. (1) අග්‍රාණ්ඩුකාරධූරය වෙනුවට ජනාධිපතිධූරයක් ඇති කිරීම
(2) පනත්වලට අවසන් අනුමැතිය දීමේ බලය 1948 අග්‍රාණ්ඩුකාරවරයාට හිමි වුවද, 1972 දී එය ජාතික රාජ්‍ය සභාවේ කථානායකවරයාට පැවරීම.

50. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය
(2) ජාතික රාජ්‍ය සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන පනත් කෙටුම්පත්වලව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂාකර බලා අනුකූල නොවන්නේ නම් එවැනි පනත් කෙටුම්පත් සම්මත කළයුතු ආකාරය පිළිබඳ ජාතික රාජ්‍ය සභාවට උපදෙස් හා සහය ලබා දීම සඳහා

## II පත්‍රය

### I කොටස

01. දේශපාලනය ශාත්ත්‍රීය ලෙස අධ්‍යයනය කිරීම පිළිබඳ දක්වා පහත පැතිකඩ පිළිබඳ කෙටියෙන් විස්තර කර තිබිය යුතු ය.

- දේශපාලන ආයතන
- දේශපාලන භාවිතයන්
- ආණ්ඩුකරණය
- දේශපාලන චර්යාව
- දේශපාලන මතවාද

02. දේශපාලනය පහත පරිදි ප්‍රධාන අර්ථ දෙකකින් යුක්ත වන බව දක්වා ඒවා වෙන් වෙන් වශයෙන් විස්තර කර තිබිය යුතු ය.

රාජ්‍ය, රාජ්‍ය පරිපාලනය සහ ආණ්ඩුකරණය පිළිබඳ ඇගවෙන සංකල්පයක් ලෙස

රාජ්‍යයට පමණක් සීමා නොවී රාජ්‍යයෙන් බාහිරව ද පුරවැසියන් සහභාගී වන සමාජ භාවිතයක් ලෙස

03. එක් එක් ප්‍රවේශ පිළිබඳ කරුණු දක්වා තිබිය යුතු ය.

### II කොටස

04. නූතන ජාතික රාජ්‍ය හා යටත් විජිත රාජ්‍ය යන මාතෘකා යටතේ ඒ ඒ රාජ්‍ය හඳුන්වා ඒවායේ ලක්ෂණ හා ක්‍රියාත්මක කාලය පිළිබඳ විස්තර කර තිබිය යුතු ය.

05. සන්ධීය ආණ්ඩුක්‍රමයේ හා ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ වෙන් වෙන්ව දක්වා සංසන්දනය කර වෙනස්කම් පෙන්විය යුතු ය.

06. ඒ ඒ ආණ්ඩුක්‍රමය හඳුන්වා ලක්ෂණ කෙටියෙන් විස්තර කර තිබීම.

07. (I) රාජ්‍ය හා ආණ්ඩුව මූලික හා කේන්ද්‍රීය ආයතන බවත් සමාජයේ බොහෝ ආයතන උපත ලබන්නේ රාජ්‍ය හා ආණ්ඩුව වෙතින් බවත් දක්වා පහත තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

- ආණ්ඩුව යනු රාජ්‍යයේ නියෝජිතයා බව
- ආණ්ඩුව යනු රාජ්‍ය නිර්මාණය වීම සඳහා අවශ්‍ය අංග ලක්ෂණවලින් එකක් බව.
- පූර්ව ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල මේ දෙක අතර වෙනසක් නොමැති බව
- මේ දෙක වෙන්වීම රාජාණ්ඩුව බිඳ වැටීමෙන් පසු බිහි වූ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයේදී සිදු වූ බව
- රාජ්‍ය අදෘශ්‍යමාන බව හා ආණ්ඩුව දෘශ්‍යමාන වන බව
- රාජ්‍යයට නිශ්චිත භූමියක් අවශ්‍ය බවත් ආණ්ඩුවට අවශ්‍ය නොවන බවත්
- රාජ්‍යයට ස්වාධීපත්‍ය බලය හිමි බවත් ආණ්ඩුවට හිමි නොවන බවත්

- රාජ්‍යයෙන් පසු ආණ්ඩුව බිහි වූ බවත්
- රාජ්‍ය පරිපූර්ණ ආයතනයක් බවත් ආණ්ඩුව එහි කොටසක් බවත්
- ආණ්ඩුවට ක්‍රියාත්මක විය හැක්කේ රාජ්‍යයේ අවසරයකින් යුතුව බවත්

  ආදිය ගැලපෙන පරිදි විස්තර කර තිබිය යුතු ය.

(II) දේශපාලන පක්ෂ හා බලපෑම් කණ්ඩායම් වෙන් වෙන්ව අර්ථ දක්වා උදාහරණ ද ඉදිරිපත් කර මේ දෙකේ වෙනස්කම් දැක්විය යුතු ය.

- දේශපාලන පක්ෂයක අරමුණ ආණ්ඩු බලය දිනාගැනීම බවත් බලපෑම් කණ්ඩායමක අරමුණ ආණ්ඩුවට බලපෑම් කිරීම මගින් ඉල්ලීම් දිනාගැනීම බවත්
- දේශපාලන පක්ෂ ආණ්ඩු තුළට ගොස් රාජ්‍ය ප්‍රතිපත්ති තීරණ ආදියට බලපෑම් කරන බවත් බලපෑම් කණ්ඩායම් ආණ්ඩුව තුළට නොයා ආණ්ඩුවේ තීරණවලට බලපෑම් කරන බවත් ආදී වෙනස්කම්.

## III කොටස

08
- රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
- විවෘත් වෙළඳපොළක් හඳුන්වා දීම.
- ව්‍යවස්ථාදායක, විධායක සභා පිහිටුවීම.
- රාජ්‍ය වෙළඳ ඒකාධිකාරිය අහෝසි කිරීම.
- ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
- අධිකරණ ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම.
- සිවිල් සේවය ප්‍රතිසංවිධානය කිරීම.
- ද්විත්ව පාලනය අහෝසි කිරීම.
- පාලන බලය මධ්‍යගත කිරීම.
- ආණ්ඩුකරණයේ බලතලසීමා කිරීම ... ආදිය දක්වා

එමගින් ලංකාව තුළ ඇති වූ වෙනස ඉදිරිපත් කර තිබිය යුතු ය.

09 මෙම ආණ්ඩුක්‍රම දෙකෙහි මූලික කරුණු ඉදිරිපත් කොට සෝල්බරි ආණ්ඩුක්‍රමයට වඩා 1972 ආණ්ඩුක්‍රමය වෙනස් වන පහත කරුණු ඉදිරිපත් කොට තිබිය යුතු ය.

- ආණ්ඩුකාරධුරය වෙනුවට ජනාධිපති ධුරය
- සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ පාර්ලිමේන්තුවට ස්වාධිපත්‍යය නොතිබූ බවත් 1972 යටතේ ජාතික රාජ්‍ය සභාවට පරමාධිපත්‍ය තිබූ බවත්
- ව්‍යවස්ථාදායකයන් හඳුන්වන නම් හා නිල කාලය
- 1947 ආණ්ඩුක්‍රමය යටතේ පනත්වලට අවසන අනුමැතිය දුන්නේ අග්‍රාණ්ඩුකරු වුවත් 1972 ආණ්ඩුක්‍රමය යටතේ එම කාර්යය ජාතික රාජ්‍ය සභාවේ කථානායක විසින් කළ බවත්
- අධිකරණ සේවයේ ස්වාධීනත්වය හා රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය සඳහා ආණ්ඩුක්‍රම දෙකෙහි ස්ථාපිත කළ ආයතන වෙනස් බව
- 1947 ට සාපේක්ෂව 1972 රාජ්‍ය සේවයේ හා අධිකරණ සේවයේ ස්වාධීනත්වය අහෝසි වූ බව
- 1972 යටතේ සෙනෙට් මණ්ඩලයන් නොසිටි බව ........ ආදී නිවැරදි තොරතුරු ඉදිරිපත් කොට තිබිය යුතු ය.

10 ඒ ඒ මාතෘකා පිළිබඳ ප්‍රමාණාත්මකව තොරතුරු ඉදිරිපත් කොට තිබිය යුතු ය.